ආයෝජන

# සුළු ගොවියාට විනිමය ඉපදිය හැකි මගක්

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ විශාල පෙරළියකට ඉඩකඩ වත්මන් නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය නිසා මහ පැදී ඇත. මෙතෙක් දේශීය පාරිභෝජනය අවශ්‍යතා සඳහා කැප වූ ග්‍රාමීය කෘෂි කාර්මික අංශය මගින් විදේශ විනිමය ඉපයීම මෙම පෙරළියයි.

මෙබඳු ක්‍රියාවලියක් සඳහා ශ්‍රී ලංකාවට හැකියාවන් රැසක් ඇත්තේ ය. නිරක්ෂයට ඈතින් පිහිටි රටවල් ශීත සෘතුව ඔවුන්ගේ කෘෂි නිෂ්පාදන ක්‍රියා වලියට මහඟු බාධාවකි. සර්ම කලාපීය රටවල් ගණයට වැටෙන අප එවැනි බාධාවල් වලින් තොර නිසා වර්ෂයේ සෑම දිනකම පාහේ ඒකාකාර දේශ ගුණික තත්ත්වයකට මුහුණ පාන්නෙමු. වැසි කාලය හා වියළි කාලය යන ස්ථිර දේශගුණික සීමාවකින් ද සෑහෙන දුරට මිදී සිටින්නෙමු. එසේ වී ඇත්තේ අපගේ ස්වාභාවික ජල සම්පත් ඉතාම උචිත ආකාරයට හසුරුවා ගැනීමට අතීතයේ සිට අප පුරුදු වී සිටින නිසාය. මෙවැනි මහඟු දේශගුණික අවස්ථාවන් උපයෝගී කර ගනිමින් අප රටේ විවිධ කෘෂි කාර්මික භෝග වර්ෂය පුරාම නිපදවිය හැක. එම නිසා විදේශීය වෙළඳ පල වලට උචිත ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාපවල වගා කිරීමට හැකි කෘෂි භෝග කුමක්දැයි හොඳින් නිරීක්ෂ ය කර ඒ අනුව කෘෂි භෝග වගා කිරීමේ රටාවක් ද ඒ හා දැඩි බැඳීමක් ඇති අලෙවි රටාවක් පිහිටුවා ගැනීම සුළු ආයෝජන වර්ධනය කිරීමට ඇති ක්‍රමයයි.

මෙබඳු ක්‍රියා වලියන් සඳහා නිරතවන සුළු ගොවියා අංශ දෙකක් කෙරෙහි අවධානය යොමු කළයුතු වෙයි.

ඒවා නම් :

(1) කෘෂිකර්ම භෝග නිෂ්පාදනය වැඩි දියුණු කිරීම හා අලෙවි රටාව වැඩි දියුණු කිරීම,

(2) පාරිභෝගික රුචියට ගැල්පෙන ආකාරයට කෘෂි භෝග සකස් කිරීම.

මෙම අවශ්‍යතා පිළිබඳ තවත් පැහැදිලි කළහොත්, යම් භෝගයක නිෂ්පාදනය දේශීය අවශ්‍යතා සැපිරිය යුතු වෙයි. එසේ නොවුවහොත් අපනයනය කිරීමට අති ඉඩකඩ ඇසිරී යයි. ඒ සමගම යම් භාණ්ඩයක් නිපදවූ පමණින්ම එයට විදේශ වෙළඳ පොළක් සොයා ගැනීම අපහසු ය. ඒ සඳහා මනා ප්‍රවාහන රටාවක්, අලෙවි රටාවක් අවශ්‍යවේ. මේ අංශ දෙකම සුළු පරිමාන ආයයෝජනයන්ට සිය ආයෝජනයන් යෙද වීමට සුදුසු මාර්ග වේ.

කලාරංජි මහේස්වරන් විසිනි.

තවත් වැදගත් අංශයක් නම් භෝග පාරිභෝගිකයා එය රුචියට ගැලපෙන අයුරින් සකස් කිරීමයි. ඉන් එක් පියවරක් ගොවිපල මට්ටමේ දී කළ හැකිය. ජනප්‍රිය වර්ගයේ භෝග ජනප්‍රිය ආකාරයට වැවීම භෝගය නිෂ්පාදනය වූ පසුව, ඒවා සුදුසු ලෙස සැකසීම අනෙක් මට්ටමයි. උදාහරණයක් වශයෙන් මාංශ භෝග මනා ලෙස පිළියෙල කර පරිප්‍රු බවට පත්කළ හැකියි.

මෙබඳු විදේශ විනිමය උපයන සුළු පරිමාන ආයෝජකයන් සඳහා රජයෙන් දිරි ගැන්වීම් රාශියක් ලබා දී ඇත. ඉන් පළමුවැන්න සුළු පරිමාන නිෂ්පාදන සඳහා වෙළඳ පල තොරතුරු විමර්ශනය කර එම තොරතුරු දේශීය නිෂ්පාදනයන්ට ලබා දීමයි.

විදේශීය වෙළඳ පලට නිපදවන්නන් බදු සහන සැළසීම හා එම කටයුතු වල නියැලී සිටින්නන්ට ප්‍රචාර දිරි දීමනා ලබා දීම ඉන් කිහිපයකි.

විදේශීය වෙළඳ පලට විසිතුරු මල් වර්ග නිපද වන්නන්ට එයාර් ලංකා ගුවන් සේවය මගින් සහන මුදලකට භාණ්ඩ ප්‍රවාහන පහසුකම් ලබා දී ඇත. ලක්මල් සළ නමින් යන විසිතුරු මල් වවන්නන්ගේ

සංගමයක් පිහිටුවා ගැනීම නිසා මෙම සහනය ලැබී අ ත. මේ ආකාරයට විවිධ කෘෂි භෝග වැවීමට පෙළඹෙන ආයෝජකයන් එක් වී සංවිධානයක් ලෙස කටයුතු කිරීමෙන් ඒ ඒ භෝග වලට ලැබිය යුතු අතිරේක සැලකිලි පිහිටුවා ගත හැක.

විට විදේශ විනිමය උපයා ගත හ ක. ලාංකික වෙළඳ පලට අවශ්‍ය කරන පිටරටින් ආනයනය කරන කෘෂි භෝග නිපදවීමෙන් ඒ භෝග ආනයන කිරීම සඳහා වැයවෙන ව්දේශ විනිමය ඉතිරි කරගත හැක.



බොහෝවිට විදේශ වෙළඳ පලවල් වලට අවශ්‍ය කරන එළවළු, පලතුරු ඇතුළු නොයෙකුත් අන්‍ය කෘෂි බෝග ලංකාවේ ඕනෑ කරන පරිදි ඉස්තරම් භාවයක් ඒ භෝග වලින් ලබා ගැනීමට නම් නව තාක්ෂණයක් හා උපදෙස් අනුගමනය කිරීමත් මෙන්ම ඒ හා නියැලීමට දැනුමක් අත්‍යවශ්‍යවේ. දූන් කරගෙන යන කෘෂිකර්ම භෝග නිෂ්පාදන ක්‍රියාවලී කිහිපයකම විදේශීය විශේෂඥයන්ගේ සහායෙන් පිහිටුවා ඇත. විසිතුරු මල් වාගවන් (කානේෂන්, පිර්වරා) ජපාන විශේෂඥයන්ගේ සහායෙන් නුවර එළියේ පිහිටුවා ඇමෙරිකානු තාක්ෂණික විශේෂඥයන් ගේ සහායෙන් ඇමෙරිකානු වෙළඳපලට තත්කාල මුහුම් බීජ නිපදවීමේ ක්‍රියා මාර්ගයක් මීට වසරකට පමණ ඉහත දී කල්පිටිය පෙදෙසේ ආරම්භ කරන ලදී. මේ භෝග අපනයනයෙන් ලාංකික වෙළඳපලට ඒ හැරුණ

පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය, රුචිකත්වය ආදායම යනාදී නොයෙකුත් කරුණු රැසක් උඩය. විදේශ විනිමය උපයා ගැනීම අපගේ මූලික, පරමාර්ථය වුව ද ඒ සමහම කෘෂි භෝග නිෂ්පාදන රටාවක් සංවිධානය කිරීමට අවශ්‍ය වන දැනුම ලබා ගැනීම ඒ අතින් අප ජනතාවගේ අවබෝධ කිරීමේ හැකියාවන් නංවාලීම, අවසාන වශයෙන් අප ජනතාව ගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම අවසාන පරමාර්ථයයි.

මෙබඳු පරමාර්ථ ඇති විදේශ විනිමය ලබා දෙන කෘෂි ආයෝජන කළ යුතු ආකාරය, ඒවාට ලබා දෙන පහසුකම් ආදිය විස්තර කෙරෙන ලිපි පෙලක් ලබන කලාපයේ සිට ආරම්භ වේ. මෙම ලිපි පෙල සකස් කිරීමේ දී ශ්‍රී ලංකා ව්‍යාපාර සංවර්ධන මණ්ඩලය හා කෘෂකර්ම උපදේශක සමාගමක් වන කූපර් සහ ලයිබ්‍රෑන් සමාගමත් ඒකාබද්ධව කරන ලද පර්යේෂණ වල ප්‍රතිඵල ද උපයෝගී කරගෙන ඇත.